# 2019 අප්‍රේල් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2019 අප්‍රේල් මස මාසික සභා රැස්වීම 2019.04.11 වන දින පෙ.ව. 10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. සංවර්ධන නිලධාරී - එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, කාර්යමණ්ඩලය ඇතුළු,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2019.03.14 මාසික සභා වාර්තාවේ අංක 9 වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විසින් "පර්චස් 30ක ප්‍රමාණයක් ක්‍රීඩා පිටිය වෙනුවෙන් වෙන් කර ඉතිරි කොටසේ මෙම නිවාස ව්‍යාපෘතිය සිදු කරන බව ප්‍රකාශ කරන ලදී" එය "පර්චස් 30ක ප්‍රමාණයක් නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර ඉතිරි කොටස ක්‍රීඩා පිටිය සඳහා යොදාගන්නා බව ප්‍රකාශ කරන ලදී" ලෙස නිවැරදි විය යුතුබව එතුමා විසින් සඳහන් කරන ලදී.තවද තලගස්කන්ද ක්‍රීඩා පිටියේ සිදුකරන නිවාස ව්‍යාපෘතියට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විරුද්ධ වූ බව සඳහන් වී නොමැති බව පෙන්වා දෙන ලදී.ඒ අනුව එම සංශෝධනයන්ට යටත්ව 2019.03.14වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

කේ.ඩී.සෝමසිරි මහතා නමින් PL77 අංක දරණ ජල බිල් පත කේ.ඩී.උදය සඳරුවන් මහතා නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. වරිපනම් බදු කපාහැරීම හා වරිපනම් බදු බිල් කිරීම නතර කිරීම

මෙම සභා බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ සිට දියුණු ගම් ප්‍රදේශයන් බවට හඳුනාගත් ඕපනායක කොට්ඨාශයේ ගල්හිර පාර,හත්තැල්ල පාර,උඩවෙල පාසල් පාර,කන්දෙවිහාර පාර,මහින්දාරාම පාර,පොල්බොක්ක පාර,නව ගම්මාන පාර,තැන්නහේන පාර,කට්ටංගෙ පාර හා වැලිගෙපොල කොට්ඨාශයේ අම්බැවිල පාර, පල්ලෙබැද්ද පාර ,වැලිගෙපොල පාර, සඳගනාගම පාසල් මාවත, රංවල පාර, හටංගල පාර ,වැලිගෙපොල - බළන්ගොඩ පාර යන ප්‍රදේශවල වරිපනම් බදු ගෙවීම් විරෝධතා හේතුවෙන් 2014 වර්ෂයේ සිට අදාල වරිපනම් බදු නොගෙවීම නිසා 2018.12.31 දක්වා ලේඛන ගතවී ඇති හිඟ මුදල් ලේඛන වලින් කපා හැරීමටත්,2019 වර්ෂයට එම වරිපනම් බදු බිල් කිරීම නතර කිරීමටත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇතිබව දන්වා එවූ පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG-5/2/7(11)/10 හා 2019.04.03 දිනැති ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. ගම්පෙරළිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) -2019

ඉහත කරුණ පිළිබඳව ඔපනායක ප්‍රාදේශීය ලේකම්ගේ අංක OPDS/PLD/DV/01/RRDP/GAM/2019 හා 2019.03.27 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.2. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2019

ඉහත කරුණ සම්බන්ධව වැලිගෙපොල ප්‍රාදේශීයලේකම්ගේ අංක WEDS/PLD/DV/3/RIDP/1/2/4/2019 හා 2019.04.05 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ලියන්වින්න ජල ව්‍යාපෘතියට අළුතින් ජල මෝටර් දෙකක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

II. පීල්ලවත්ත බහුකාර්ය ගොඩනැගිල්ලට බ්ලොග් ගල් 1000ක් ලබා දීම සුදුසු බවත්,

III. ප්‍රාදේශීය සභාවට විදුලි ජනන යන්ත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

IV. බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය මධ්‍ය මහා විද්‍යාලයේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන තරුෂ තේජාන් ප්‍රනාන්දු සිසුවාගේ ක්‍රිකට් දක්ෂතාව වෙනුවෙන් අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම සුදුසු බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව I සිට IV දක්වා යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා විසින් පහත යෝජනා හදිසි යෝජනා ලෙස සභාවට ඉදිරිපත් කරන ලදී.

V. පහත සඳහන් දේපළ වෙනුවෙන් බදු මුදල් නොගෙවීම නිසා එම ගිවිසුම් ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සභා අනුමැතිය ඉල්ලා සිටින ලදී,

- ඔපනායක පොල ඉදිරිපිට කඩකාමර අංක 07
- ගල්පාය කඩකාමර අංක 01
- ගල්පාය කඩකාමර අංක 02

- ගල්පාය කඩකාමර අංක 03
- ගල්පාය කඩකාමර අංක 04
- ගල්පාය කඩකාමර අංක 05
- වැලිගෙපොල සති පොල
- වැලිගෙපොල මාළු ලැල්ල

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත කී වැලිගෙපොල සතිපොල නැවත ටෙන්ඩර් කරන තුරු සභාවේ නිලධාරියෙකු යොදවා මුදල් අයකිරීමටත්,වැලිගෙපොල මාළු ලැල්ල හිඟ මුදල් නොගෙවන්නේ නම් නැවත ටෙන්ඩර් කිරීමටත්, තීරණය වූ අතර ,ගරු සභාපතිතුමාගේ එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VI. සබරගමුව පළාත් මධ්‍ය පුස්තකාලය මගින් පළාතේ මහජන පුස්තකාල පාඨකයින් සඳහා පොත් බැහැර දීම "අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය " යටතේ සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර ඒ සඳහා වූ ගිවිසුමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත්,

VII. හුණුවල ධර්මරාජ විද්‍යාලයේ ජල මාර්ගය අළුත්වැඩියා කර අමතර ජල ප්‍රමාණය ප්‍රාදේශීය සභාවේ ජල යෝජනා ක්‍රමයට එකතු කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ,ගරු සභාපතිතුමාගේ VI හා VII යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවති මැතිතුමිය

I. දූනුකාරගොඩ හංගමුආරච්චිගොඩ ගමේ ආනන්ද මහතාගේ නිවස අසල සිට වසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍යා බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. හපුගස්යාය මාර්ගය සකස්කර ගැනීම සඳහා **JCB** යන්ත්‍රය අවශ්‍යා බවත්,

II. ගල්පාය පොල්වගාව දෙවට පාර බොරළු දමා සකස් කිරීම අවශ්‍ය බවත් ,යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

### 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

I. පින්නගල බෝධිය අසලට සහ බෝල පිට්ටනිය අසල තුංමන්හන්දියට වීථි පහන් සවිකිරීම අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පොල්බොක්ක ගමේ පානීය ජලය ලබා ගන්නා ලිඳ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත්,

II. දාන්දාව පාලම අළුත්වැඩියා කිරීම සුදුසු බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී දාන්දාව පාලම පිළිබඳ අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා දාන්දාව පාලම ගමන් කිරීමට නොහැකි මට්ටමටම අබලන්වී ඇති අතර වාහන ගමන් කිරීම දැඩි අවධානම් බැවින් සභාවට අදාල කාර්යයක් නොවුවත් වගකිවයුතු පාර්ශවයන් විසින් කිසිදු පියවරක් නොගන්නා නිසා ප්‍රදේශයේ ජනතාවගේ අපහසුතාව හා අවධානම සළකා බලා එය අළුත් වැඩියා කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.ඒ අනුව ගරු මන්ත්‍රීතුමාගේ ඉහත යෝජනා දෙක ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 6.1. 2019.03.14 වන දින හා 2019.04.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 428 සිට 496 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2019 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් හා බදු | 570,706.51 | වැටුප් හා දීමනා | 2,418,678.62 |
| කුලී | 23,329.56 | ගමන් වියදම් | 55,990.00 |
| බලපත්‍ර ගාස්තු | 173,750.00 | සැපයුම් හා උපකරණ | 279,820.00 |
| සේවා සඳහා ගාස්තු | 68,684.14 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 332,555.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 694,504.00 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 267,787.04 |
| වෙනත් ආදායම් | 4,905,460.10 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| ආදායම් ආධාර | 2,127,418.97 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 8,563,853.28 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 30,322.28 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,385,152.94 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 8,563,853.28 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 43,712.78 | සේවක ණය | 290,940.00 |
| තැන්පත් | 134,345.00 | තැන්පත් | 4,500.00 |
| අත්තිකාරම් | - | ණයහිමි | 129,028.26 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 178,057.78 | සමුච්චිත අරමුදල | 14,092.00 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 438,560.26 |
| මුළු එකතුව | 8,741,911.06 | මුළු ගෙවීම් | 3,823,713.20 |

## 7.2. 2019 පෙබරවාරි 28 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම | 2019.02.28 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන් තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 5827830 | 1940000 | **211880** | **4%** | **503591** | **26%** | **1436409** | 5615951 |
| 2 | අක්කර බදු 1.12 | 74020 | 20900 | **271** | **0%** | **987** | **5%** | **19913** | 73749 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 200000 | | | **25700** | **13%** | **174300** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 267600 | - | | **44400** | **17%** | **223200** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 808000 | - | | **163250** | **20%** | **644750** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **1500** | **5%** | **28500** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 467000 | | | **12378** | **3%** | **454622** | |
| 8 | ජල ගාස්තු 4.14 | 2140545 | 6705000 | 838330 | **39%** | **166186** | **2%** | **6538814** | 1302215 |
| 9 | විකුණුම් | | 564500 | | | **60901** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 845500 | | | **0** | **0%** | **845500** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 300000 | | | **62673** | **21%** | **237327** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 183158 | 463200 | 0 | **0%** | **0** | **0%** | **463200** | 183158 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 94000 | | | **2553** | **3%** | **91447** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 0 | 254000 | 0 | | **26000** | **10%** | **228000** | - |
| 18 | බොජුන් හල සඳහා ගාස්තු5.23(3) | | | | | **0** | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **30000** | **8%** | **370000** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **10500** | **4%** | **289500** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | 0 | 0% | 2,000 | |
| 22 | වෘත්තීය බලපත්‍ර 1.33 | | 100 | | | - | 0% | 100 | |
| 23 | පොලී ආයෝජන 1.61 | | 500 | | | | 0% | 500 | |
| 24 | සේවක ණය පොලී1.64 | | 40000 | | | 8488 | 21% | 31512 | |
| 25 | අයකර ගතහැකි ගාස්තු2.43 | | 25000 | | | 0 | 0% | 25000 | |
| 26 | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | 1000 | | | - | 0% | 1000 | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම | 2019.02.28 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන් තුගත ආදායමෙන් | හිඟයන් |
| 27 | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | 500 | | | - | - | 500 | |
| 28 | අය කර ගත හැකි ගාස්තු 4.43 | | 1000000 | | | 144000 | 14% | 856000 | |
| 29 | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | 5000 | | | - | - | 5000 | |
| 30 | පොළ භූමිය කුලියට දීම5.25 | | 1000 | | | - | - | 1000 | |
| 31 | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | 2000 | | | 0 | 0% | 2000 | |
| | **වෙනත් ආදායම්*** | 44488 | 878140 | 0 | 0% | 69608 | 8% | 808533 | |
| | **මුළු එකතුව** | **8270041** | **15915940** | **1050481** | **13%** | **1332714** | **8%** | **14079627** | **7175072** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.02.28 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන් තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 4.00 | 3% | 146 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 20000 | 107000 | - | - | - | 0% | 107000 | 20,000.00 |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 23000 | 12% | 177000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 510 | 3% | 14490 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 2025 | 10% | 17,975 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 24488 | 448390 | 0 | 0% | 30352 | 7% | 418038 | 24,488.23 |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 13717 | 16% | 73,883.1 | |
| | එකතුව | 44488 | 878140 | 0 | 0% | 69608 | 8% | 808533 | 44,488.23 |

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බවත්,සභාවේ ක්‍රියාත්මක වූ යෝජනා පිළිබඳ වාර්තාවක් ඉදිරි සභා වාර වලදී ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

ලබන්නා වූ සිංහල හා හින්දු අළුත් අවුරුද්දට සුභපැතුම් එක්කරමින් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා උඩවෙල අම්බැවිල මාර්ගය සම්බන්ධ සිදුවෙන යම් යම් සිදුවීම් පිළිබඳ සියළුදෙනා දැනුවත් කිරීමේ අරමුණින් අදහස් දැක්වූවේය. උඩවෙල නගරයේ පැවති විරෝධතාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා විශාල මෙහෙයක් ඉටුකල බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ්එම්.අයි.සමන්ජීව මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගේ සහය ලැබුණු අතර එහිදී සියළු දෙනාගේ පොදු මතයන් වූයේ දේශපාලනය මැදිහත්

නොවීම,පොරොන්දු දේශපාලනයට නොයාම හා ස්ථිර විසඳුමක් ලබා ගැනීම යන්නයි.උත්සෝෂණ අවස්ථාවේදී හිටපු පළාත් සභා මන්ත්‍රී අතුල කුමාර රාහුබද්ද මැතිතුමා ඊට සම්බන්ධ වී අතිගරු ජනාධිපතිතුමා හමුවීමට අවස්ථාව සලසා දෙන බවට පොරොන්දු වූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොමැති වීමහේතුවෙන් නැවත අම්බැවිලේදී උත්සෝෂණ ක්‍රියාමාර්ගයක් ගත් බවද සඳහන් කලේය.යලිත් වරක් උත්සෝෂණයක් කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අප්‍රසාදයපල වී තිබුණ බව දැණගන්නට ලැබුණු බවද මෙහි දී ගරු මන්ත්‍රීතුමා විසින් වැඩි දුරටත් කරුණු අවධාරණය කරන ලදී.කෙසේ වුවද අවස්ථාවාදී දේශපාලනයට නතු නොවී මාර්ගය පිළිසකර කර ගැනීමේ දැඩි අවශ්‍යතාව කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් ජනතාවගේ මෙම අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කරන ලෙස හිටපු පළාත් සභා මන්ත්‍රී අතුල කුමාර රාහුබද්ද මැතිතුමා දැණුවත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

## II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා වැරදි වැටහීමක සිටින බවත්,දේශපාලනය මැදිහත් කර නොගන්නා බව පැවසුවත් මාර්ගයේ වැඩ ආරම්භ කිරීමට දේශපාලන නායකත්වයක් අවශ්‍ය බවත් නිලධාරීන්ගෙන් මෙම කාර්යය ඉටුකර ගත නොහැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා ප්‍රකාශ කලේය.වැඩි දුරටත් අදහස් දක්වමින් ගරු මන්ත්‍රීතුමා , හිටපු පළාත් සභා මන්ත්‍රී අතුල කුමාර රාහුබද්ද මැතිතුමා එම අවස්ථාවට පැමිණ යම් පොරොන්දුවක් ලබා දුන් බැවින් තමන් විසින් එතුමා හමුවීමට ගිය බවත්,ඒ සඳහා සහභාගි වන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමාට දැන්වූ බවත්,එහිදී අතුල කුමාර රාහුබද්ද මැතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර ඉදිරියේදී මාර්ගය පිළිසකර කිරීමට කැමැත්ත ලබා ගත් බවත් ප්‍රකාශ කලේය.ගරු ආණ්ඩුකාරතුමා මාර්ගය හදන බවට පොරොන්දු වී තිබියදී අම්බැවිල කල උත්සෝෂණය හේතුවෙන් එතුමා අප්‍රසාදය පල කර ඇති බවත්,.මෙම ගැටළුව හේතුවෙන් තමන් හැම පැත්තෙන්ම තැලෙන බවත් ප්‍රකාශ කල ගරු ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා,කුමන දේශපාලන පක්ෂයක නායකයකු වුවද මෙම මාර්ගය සෑදීමට ඉදිරිපත් වන්නේ නම් තමන් ඊට සහය පල කරන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,පළාත් සභාවට අයත් මාර්ග පසුගිය කාලය තුල නිසි ලෙස නඩත්තු නොකිරීම මෙයට හේතුව බවත්,කොන්ත්‍රාත් කරුවන්ගේ පවතින ගැටළු හේතුවෙන් මාර්ග නිසි ලෙස සකස් නොකරන බවත්,පෙන්වා දෙන ලදී.කෙසේ වෙතත් මාර්ග සංවර්ධනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ දැඩි උනන්දුවක් පවතින බවත් ,ඉදිරියේදී හිටපු දේශපාලනඥයින්ගේ මැදිහත් වීමක් සිදු නොවූවත් ගරු ආණ්ඩුකාරතුමා අදාල නිලධාරීන් සමඟ අකරුල්ල මාර්ගය සංවර්ධනයට පියවර ගනු ඇතැයි ගරු සභාපතිතුමා පැවසුවේය.

## III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් සිය පියාණන්ගේ අවමංගලයට සහභාගීවූ සියළු දෙනාටත්,සහය දැක්වූ සියළු දෙනාටත් සිය ස්තූතිය පල කළේය.

## IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

වෙනත් කරුණු යටතේ රටේ පොදු ප්‍රශ්නයක් වුවත් ,එය ප්‍රදේශයේ ජනතාවටත් බලපාන බැවින් ඒවා සම්බන්ධව විවාද කිරීමට සභාව තුල අවස්ථාව සළසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.තවද, හත්තැල්ල පාර,අකරැල්ල පාර,ඉලුක්කුඹුර පාර හා ගල්පාය පාර ප්‍රාදේශීය සභාව සතු ප්‍රධාන පාරවල් හතරක් වන අතර ඒවා මේවන විට ඉතා අර්බුදකාරී තත්වයකට පත්ව ඇති බැවින් සියළු සභික මහත්ම මහත්මීන්ගේ වගකීම වන්නේ ඒවා වෙනුවෙන් කුමක් හෝ සිදුකිරීම බවත් ජනතාවට දැනෙන මෙවන් ගැටළු පිළිබඳ විවාදයක් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමාගේ පියාණන්ගේ අභාවයට සියළුදෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා,රංවල රෝහලේ සිටින වෛද්‍යවරියක ප්‍රසූත නිවාඩු ලබාගෙන ඇති බැවින් මේ වන විට එක් වෛද්‍යවරයකු උදෑසන 7 සිට දහවල් 12 වන තෙක් පමණක් බෙහෙත් ලබා දෙන බවත් ,රෝහලට රෝගීන් ඇතුලත් කර නොගන්නා බවත්,ඒ හේතුවෙන් රෝගීන් දැඩි පීඩාවට ලක්වන බවටත් කරුණු අනාවරණය කලේය.මේ සම්බන්ධව ගරු අණ්ඩුකාරතුමා ,ප්‍රධාන ලේකම්තුමිය හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ දැනුවත්කර පල්ලෙබැද්ද රෝහලේ සිටින වෛද්‍යවරයකු හෝ අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලා සිටිමින්,ලබන්නාවූ සිංහල හින්දු අළුත් අවුරුද්දට සියළුදෙනාට සුභ පැතුම් එක් කලේය.

### VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහන විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් හුණුවල වතු රෝහලේ නිලධාරීන් මාරු කිරීම නිසා නිලධාරී හිඟයක් පවතින බවත්,රෝගින් මෙන්ම එහි සිටින වෛද්‍යවරුන්ද මෙහිදී දැඩි අබහසුතාවට පත්වන බවත්,පෙන්වා ඒ සම්බන්ධව පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ සැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

තවද, සී/ස අටකලන් සමූපකාර සමිතියට අයත් ඕපනායක පොලීසිය ඉදිරිපිට ඇති ඉඩම බදු දී ඇති අතර එහි පතල් කැණීම් සිදු කරන බසට සී/ස අටකලන් සමූපකාර සමිතියේ ගරු සභාපති හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණාසේන ගුරුගේ මැතිතුමාට පසුගිය දිනක චෝදනාවක් එල්ලකර තිබූ අතර ඒ පිළිබඳ කල විමර්ෂණයේදි එහි කිසිදු සත්‍යතාවක් නොමැති බවට තහවුරු වී ඇති බව ප්‍රකාශ කලේය.එම සභාපතිතුමා එවැනි චරිතයක් ඇති පුද්ගලයකු නොවන බව සභාවේ එතුමා හඳුනන සියළුදෙනා දන්නා බවත්,ඒ පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් සමූපකාර කොමසාරිස්තුමා දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

### VII. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා සඳහන් කල ආකාරයට පල්ලෙබැද්ද සිට ගල්පාය මාර්ගයට පැලැස්තර විසඳුමක් නොකල බවත්,මාර්ගය සංවර්ධනය කිරීමට තමන් සහභාගී වූ අතර ඒ සම්බන්ධව දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කලේය.ඒ සම්බන්ධ සවිස්තර වාර්තාවක් අවශ්‍ය නම් පළාත් සභාවෙන් ලබා ගත හැකි බවත් ,නිලධාරීන්ගේ දූර්වලතා නිසා මේවා සිදුවන බවත් ගරු උප සභාපතිතුමා සඳහන් කලේය.

### සභා රැස්වීමේ නිමාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමාගේ පියාණන්ගේ අභාවයට සියළුදෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කල ගරු සභාපතිතුමා සඳහන් කලේ මාර්ග ගැටළු මෙන්ම රෝහල් පාසල් සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ විශාල දායකත්වයක් ලබා දෙන බවත්,එතුමා ප්‍රාදේශීය ආණ්ඩු සම්බන්ධ හසල දැණුමකින් හෙබි පුද්ගලයෙකු වන බැවින් සියල්ල සුහදායි ලෙස සිදුවිය හැකිබවත් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා. ලබන්නාවූ සිංහල හින්දු අළුත් අවුරුද්දට සියළුදෙනාට සුභ පැතුම් එක් කල අතර අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 12.15ට පමණ නිමාවට පත් කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය  සභාව